# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/03/17/02 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2021.01.27 |

දකුණු පළාත් සභාවේ,
ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය
ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස්/මුදල්/සැලසුම්/ඉංජිනේරු සේවා)
අමාත්‍යංශ ලේකම් (ප්‍රධාන/ක්‍රීඩා/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර) අමාත්‍යංශය
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
සියළුම ආයතන ප්‍රධානීන් වෙත

**<u>ප්‍රශංසා සහතික නිකුත් කිරීම.</u>**

ප්‍රශංසා සහතික නිකුත් කිරීමේ දී, විවිධ ආයතන විසින් විධිමත්භාවයකින් තොරව ප්‍රශංසා සහතික නිකුත් කර ඇති බව මා හට නිරීක්ෂණය වී ඇති බැවින් මින් ඉදිරියට පහත ක්‍රමවේදයන් අනුගමනය කර ප්‍රශංසා සහතික නිකුත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

**I. නියමිත ආකෘති පත්‍රය අනුව ආයතන ප්‍රධානියා විසින් පමණක් ප්‍රශංසා සහතික නිකුත් කළ යුතු ය. (පොදු 230 බී ආකෘතිය)**

**II. ප්‍රශංසා සහතික නිකුත් කිරීමේ දී අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ගත යුතු ය.**

**III. පැහැදිලි නිර්ණායක සකස් කර ඒ අනුව විධිමත් පරිදි සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. එහි දී,**

- **නිලධරයෙකු තම විෂය රාජකාරී කටයුතු වලට පරිබාහිරව සිදු කරන ආයතනික පොදු ක්‍රියාවන් වලදී හෝ විශේෂ වැඩසටහන් වලදී සෘජුවම එම නිලධරයා විශේෂ කැපවීමකින් යුතුව, වගවීමෙන් යුතුව, ස්වේච්ඡාවෙන් හා අවධානමක් නොතකා, තම රාජකාරී කාලයට අමතරව පෞද්ගලික කාලයත් ශ්‍රමයත් වැය කරමින් අප්‍රතිහත ධෛර්යයකින් යුතුව යම් ක්‍රියාවක් සිදු කරනු ලබන අවස්ථා වලදී එම අවස්ථාවට සමගාමීව ප්‍රශංසා සහතික නිකුත් කළ හැකි ය.**
- **නිලධරයෙකු ඉහත අන්දමින් ක්‍රියාකරමින් පළාත් සභාවට/ තම ආයතනයට කීර්තියක් ප්‍රශංසාවක් ලබා දීමට ක්‍රියා කොට තිබීම ද ප්‍රශංසා සහතික නිකුත් කිරීමට හේතුවක් කොට සැළකිය හැක.**

**IV. කිසිවිටෙකත් නිලධාරීන්ගේ පෞද්ගලික අභිමතය පරිදි හෝ කැමැත්ත මත කිසිදු නිලධරයෙක් සඳහා ප්‍රශංසා සහතික නිකුත් නොකළ යුතු ය.**

02. මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතන ද දැනුවත් කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**ආර්.සී. ද සොයිසා**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත.**


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"